| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/08/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................ | දිනය<br>திகதி<br>Date | 2024.09.30 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2024/12**

**සියළුම සමෘද්ධි පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්**

**<u>ජාත්‍යන්තර ළමා දිනය හා ලෝක දිළිඳුකම පිටුදැකීමේ දිනයට සමගාමීව ක්‍රියාත්මක කරන ලබන කැකුළු හා සිසුරක ළමා තැන්පතු ඇතුළු ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන</u>**

**1.හැඳින්වීම.**

2024 ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව කැකුළු /සිසුරක ළමා ගිණුම් සඳහා වූ ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් හා ඔක්තෝම්බර් 17 දිනට යෙදෙන ලෝක දිළිඳුකම පිටුදැකීමේ දිනයට සමගාමීව ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් සමෘද්ධි බැංකු හරහා දියත් කරනු ලබයි. මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන සමෘද්ධි බැංකු සහ බැංකු සමිති කළමණාකරණ මණ්ඩල තීරණ අංක 2024/131/05 අනුමැතිය මත ක්‍රියාත්මක කෙරේ.

**2. ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණු**

i. ළමා පරපුර ඇතුළු ගිණුම්හිමියන් ඉතිරි කිරීමට හුරු කිරීම සඳහා, පරිසරය සැකසීම.
ii. සිසුරක/ කැකුළු ඇතුළු අනිකුත් තැන්පත් මුදල් රැස් කිරීම තුළින් බැංකු තැන්පතු අරමුදල් වැඩිකර ගැනීම.
iii. අක්‍රීය ගිණුම් සක්‍රීය තත්වයකට නැවත පත් කර, සමෘද්ධි බැංකුව සමඟ ක්‍රියාකාරී ගණුදෙනුකරුවන් බවට පත් කිරීම.

**3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වෙන කාල සීමාව හා ප්‍රවර්ධන වැඩසටහනට ආදාල ඉතුරුම් ගිණුම්**

I. 2024 ඔක්තෝම්බර් මස 01 සිට 31 දින දක්වා කාලය පුරාවට ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වේ.
II. කැකුළු , සිසුරක, සාමාජික, සාමාජික නොවන හා දිරියමාතා ඉතුරුම් ගිණුම්

**4. ඉලක්ක සකස් කර ගැනීම**

මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, සමෘද්ධි බැංකුවට මෙන්ම නිලධාරීන්ට ඉලක්ක ලබා නොදේ. ඔබ විසින් ද ක්ෂේත්‍ර ගත නිලධාරීන්ට ඉලක්ක ලබා නොදිය යුතු අතර, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට මෙම වැඩසටහන පිළිබඳ දැනුවත් කර,ඉන් අනතුරුව ප්‍රතිලාභීන් ගිණුම්හිමියන් හා ළමුන් දැනුවත් කළ යුතුය. ඒ සඳහා සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ප්‍රජාමූල සංවිධාන නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය. තවද, ප්‍රදේශයේ ජනතාව සහ දරුවන් දැනුවත් කර, කැකුළු හා සිසුරක ළමා ගිණුම් ආරම්භ කිරීමට උනන්දු කර ගැනීමට වැඩසටහනක් සකස් කර ගත යුතු බව අවධාරණය කරමි.

5. **තිළිණ ලබාදීම හා වියදම් දැරීම**

5.1 මෙම ප්‍රවර්ධන කාලය තුළ අවම රු.500/-ක් හෝ ඊට වැඩි ඉතිරි කිරීම් මුදල් තැන්පත් කරන ගිණුම් හිමියන්ට තිළිණය බැගින් ලබාදිය යුතුය.

මෙහිදී, ප්‍රවර්ධන කාලය තුළ එක් එක් බැංකුව රැස් කරන මුළු තැන්පතු මුදලට සාපේක්ෂව 5% නොඉක්මවන මුදලක් තිළිණ සඳහා බැංකු අරමුදලින් වැයකල හැකිය. වියදම් දැරීමේදී, වැය ගිණුම - බැංකු කටයුතු ප්‍රවර්ධන ගිණුමට හර කළ යුතුය.

5.2 තැන්පතුකරුවන්ට ලබාදිය යුතු තිළිණ තෝරා ගැනීම බැංකු පාලක මණ්ඩලයේ එකඟතාවය ඇතිව, මූල්‍ය විනිවිදභාවය සුරැකෙන පරිදි **බැංකු සමිති ප්‍රසම්පාදන ක්‍රියාවලිය** හරහා සිදුකළ යුතුය.

5.3 ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ, ළමුන්, දෙමාපියන් හා පාසැල් දැනුවත් කිරීමට අත් පත්‍රිකාවක් හෝ බැනර් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නේ නම් රු.3,000/- ක උපරිම මුදලක් බැංකු අරමුදලින් වැයකළ හැක.

**6. ප්‍රගති වාර්තා ලබා දීම.**

6.1 ඇමුණුම් අංක 01 හි ආකෘතිය භාවිතා කර, බැංකුව විසින් 2024.11.08 දිනට පෙර සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියට ප්‍රගතිය ඉදිරිපත් කළ යුතු අතර, බැංකු සමිතිය ආකෘති 02 භාවිතා කර, 2024.11.13 දිනට පෙර වාර්තාව සකස් කර, දිස්ත්‍රික් සමෘද්ධි අංශයට භාර දිය යුතුය.

6.2 ඇමුණුම 02 භාවිතා කර, දිස්ත්‍රික් සමෘද්ධි අංශය සකස් කරන ප්‍රගති වාර්තාව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අත්සනින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ප්‍රගතිය. microfinanceall2021@gmail.com විද්‍යුත් ලිපිනය හරහා 2024.11.20 දිනට පෙර එවීම අනිවාර්ය බව දන්වමි.

**7.** සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති කටයුතු පිළිබඳ ඇගයීම් වැඩසටහන හා බැංකු ශ්‍රේණිගත (Grading) කිරීමේදී, මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ද, බැංකු ඇගයීමේ වැඩසටහන සඳහා සලකා බලන බවද දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 1. ලේකම්- සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - | කා.දැ.ස. |
| 2. දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කා.දැ.ස. |
| 3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | අ.ක.ස. |
| 5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | අ.ක.ස. |
| 6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | අ.ක.ස. |
| 7. ගරු සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය | - | අ.ක.ස. |

ඇමුණුම 01

**2024 ඔක්තෝම්බර් 01 ජාතික ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**........................................ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව**

| විස්තරය | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු) | වෙනත් |
|---|---|---|---|
| 01. ප්‍රවර්ධන කාලය තුළ විවෘත කල /කැකුළු/සිසුරක ගිණුම් සඳහා රැස්කළ මුදල (ප්‍රවර්ධන කාලය තුළ) | | | |
| 02. 2024.10.01 දිනට පෙර පැවති කැකුළු /සිසුරක ගිණුම් සඳහා රැස්කරන ලද මුදල (ප්‍රවර්ධන කාලය තුළ) | | | |
| එකතුව | | | |

---

ඇමුණුම 02

**2024 ඔක්තෝම්බර් 01 ජාතික ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**........................................ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව**

| බැංකුවේ නම | ප්‍රවර්ධන කාලය තුළ අළුතින්ම විවෘත කරන ලද (කැකුළු/සිසුරක) ආරම්භ කළ | | 2024.10.01 දිනට පෙර පැවති ගිණුම් සඳහා රැස්කරන ලද තැන්පතු විස්තර | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල (රු.) | ගිණුම් සංඛ්‍යාව | මුදල (රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල (රු) |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

රැස්කරන ලද ඉහළම තැන්පතු මුදලෙහි සිට අඩුම තැන්පතු මුදල දක්වා රැස්කරන බැංකු , අනුපිළිවෙලට පෙළගස්වා වාර්තාව සකස් කළ යුතුය.